වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

வருடாந்த செயலாற்றுகை அறிக்கை 2024

ANNUAL PERFORMANCE REPORT 2024



ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

கடன் இணக்க சபைத் திணைக்களம்

DEPARTMENT OF DEBT CONCILIATION BOARD

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2024

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

கடன் இணக்க சபைத் திணைக்களம்

DEPARTMENT OF DEBT CONCILIATION BOARD

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 231

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි නිවාස නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණයගැතිවී ඇති මහජනතාව එම ණයගැතිභාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායි ක්‍රියා මාර්ගයක් හඳුන්වාදීම අරමුණ කරගෙන 1941 අංක 39 දරණ සහනදායක ආඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මීට අමතරව 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මඟින් මුදල් හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණය ගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි. මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණයහිමියන්ට ද අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපල පිළිබඳව ණයකරුට පහසුවන්නාවූත් ණය හිමි පිළිගන්නාවූත් කොන්දේසි මත එම දේපල බේරා ගැනීමට උපකාර කිරීම මෙම මණ්ඩලයේ පරමාර්ථයයි. මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර, මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටු කරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාවට මෙමඟින් ලැබී ඇති සේවය අති විශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

2019 අංක 04 දරණ ණය සහනදායක (සංශෝධිත) පනත අනුව ණය සහනදායක මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වන අතර, මණ්ඩලයේ සභාපතිවරයා මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස විනිශ්චයකාර ධූරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තෙකු හෝ, නීතීඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වන්නා වූ වෘත්තීය අත්දැකීම් සහිත තැනැත්තෙකු විය යුතුය.

මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් දසදෙනා -

- නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තිය පළපුරුද්ද සහිත හෝ,
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීප ව්‍යාප්ත සේවකයක I වන ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තන් විය යුතුය
- වාණිජ ක්ෂේත්‍රයේ පලපුරුදු අයෙකු
- අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා හතරදෙනෙකු නොඉක්මවන්නා වූ හා දෙදෙනෙකුට නොඅඩු වන්නා වූ වෙනත් සාමාජියන් සංඛ්‍යාවකින් සෑම ශාඛා මණ්ඩලයක්ම සමන්විය විය යුතුය.

- සෑම ශාඛා මණ්ඩලයකම සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතු අතර, මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස විනිශ්චයකාර ධූරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තකු හෝ
- නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තිය අත්දැකීම් සහිත තැනැත්තෙකු විය යුතුය.

සෑම ශාඛා මණ්ඩලයකම අනෙකුත් සාමාජිකයන්

- නීතීඥවරයෙකු ලෙස අවුරුදු දහයකට නොඅඩු වෘත්තිය අත්දැකීම් සහිත හෝ,
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන්ගෙන් සමන්විත යුතුය.

මෙම මණ්ඩලයේ රාජකාරි කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය ඉදිරියේ එළැඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළැඹෙන ගිවිසුම් මිස මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවේ. එසේ වුවද අසාධාරණ පොළී ප්‍රමාණයන් අඩු කිරීමට ද දෙපාර්ශ්වයේ එකඟතාවය මත ණය ගෙවන කාලය දීර්ඝ කිරීමට ද, මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණයකරුවන්ට සහතිකයක් නිකුත් කිරීමට ද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කළ නොතීසීය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒකපාර්ශවික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කෙරේ. එහෙත් එසේ කරනු ලබන්නේ ලියාපදිංචි තැපෑලෙන් හා ග්‍රාම නිලධාරි තැන මඟින් අවස්ථානෝචිත පරිදි ණයහිමි වෙත දැනුම් දී ණයහිමි පාර්ශවය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යැයි මණ්ඩලයට නිශ්චිත ලෙස ඒත්තු ගියහොත් පමණි. මෙබඳු අවස්ථාවක දී එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය ණයකරු සතු වේ. වෙනත් අධිකරණයක් මේ පිළිබඳව විභාගයක් පැවත්වෙන අවස්ථාවක දී මෙම සහතිකය එම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ණය මුදල බේරුම් කිරීම සඳහා වසර 10 ක උපරිමයකට යටත්ව කාල සීමාවක් ලබාදීමටත් පොළිය අවම අනුපාතය දක්වා අඩුකිරීමටත් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක ආඥාපනත යටතේ අධිකරණයට බලතල ලබා දී ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ ණය ගණුදෙනුවලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩපිළිවෙළක් සලසාදීම.

මෙහෙවර

උකස්කරයක්, පොරොන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්ධව ගත් මුදලක් ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේදොර, ඉඩකඩම් ආදී වූ නිශ්චල දේපලක් ණය සහනදායී අන්දමට වාරික මඟින් හා අඩු පොළි අනුපාතයට ගෙවා නිදහස් කරගැනීමට ණයකරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වා දීම.

අරමුණු


නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර පොරොන්දු සිනක්කරයක් හා හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි අය විය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි, නිවාස වැනි නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණය ගැනීවී මහජනතාව එම ණයගැනිභාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වාදීම අරමුණු කරගෙන 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මීට අමතරව 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මඟින් ණය හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණයගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි. මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණයහිමියන්ට අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපළ පිළිබඳ ණයකරුට පහසුවන්නාවූත් ණයහිමි පිළිගනු ලබන්නාවූත් කොන්දේසි මත එම දේපළ බේරා ගැනීමට උපකාර කිරීමට මෙම මණ්ඩලයේ පරමාර්ථයයි.

මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටුකරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාව මෙමඟින් ලැබී ඇති සේවය අති විශාලය. තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතීඥයන් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් මහජනතාව සිදුවන සේවය ඉමහත්ය.

1.4 සංවිධාන සටහන


දෙපාර්තමේන්තුවේ ලේකම්
ගණකාධිකාරී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ද්විතියික මට්ටම
ප්‍රාථමික මට්ටම
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරීන්
ලඝු ලේඛක නිලධාරීන්
රියදුරු
කාර්යාල සේවක සේවයේ නිලධාරීන්

ණය සහනදායක මණ්ඩලයේ සාමාජිකයන්

නම	තනතුර	2019 අංක 4 දරණ ණය සහනදායක (සංශෝධිත) ආඥාපනතෙහි 2 වන උපවගන්තිය අනුව අයත්වන සේවය
ණය සහනදායක මණ්ඩලය		
1. ඩබ්ලිව්.අයිරාංගනී පෙරේරා මිය	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. කුසුම් සෙනරත් පතිරණ මිය	සාමාජික	විශ්‍රාමලත් කම්කරු විනිශ්චය සභා සභාපති / අතිරේක මහේස්ත්‍රාත්
3. ඩබ්ලිව්.සී.පුෂ්පමාලි මිය	සාමාජික	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
4. කේ.ඒච්.ප්‍රේමදාස මයා	සාමාජික	විශාමලත් බැංකු නිලධාරී
5. කේ.පී.බන්දුල රන්ජිත් මයා	සාමාජික	නීතීඥ සහ නොතාරිස්
කොළඹ ණය සහනදායක මණ්ඩලය		
1. පියසේන රණසිංහ මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. පද්මා පලිහක්කාර මිය	සාමාජික	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
3. එම්.ඒ.මිල්ටන් මාරසිංහ මයා	සාමාජික	නීතීඥ
4. සරත් චන්ද්‍රසිරි විතාන මයා	සාමාජික	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික (විශේෂ ශ්‍රේණිය)
5. සෝමපාල කරුණාතිලක මයා	සාමාජික	විශ්‍රාමලත් විදුහල්පති
ගම්පහ ණය සහනදායක මණ්ඩලය		
1. පියසීලි වික්‍රමසිංහ මතුරට මිය	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. නන්දිනී රණවක මිය	සාමාජික	විශ්‍රාමික පාර්ලිමේන්තු නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
3. ඩී.එම්.කරුණාරත්න මයා	සාමාජික	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික
ගාල්ල ණය සහනදායක මණ්ඩලය		
1. මහින්ද පිණිදිය මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. කේ.පී.ඩී.ජයන්ත ගුණරත්න මයා	සාමාජික	නීතීඥ
3. ජී.පී.පියසේන මයා	සාමාජික	විශ්‍රාමලත් බැංකු නිලධාරී
කුරුණෑගල ණය සහනදායක මණ්ඩලය		
1. ආර්.එම්.පි.එස්.කේ.රත්නායක මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. ජේ.ජී.එන්.තිලකරත්න මයා	සාමාජික	විශ්‍රාමික පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
3. විමලා සේනානායක මිය	සාමාජික	නීතීඥ සහ නොතාරිස්

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2024.01.01 සිට 2024.12.31 දක්වා ණය සහනදායක මණ්ඩලයේ කාර්ය සාධනය

විස්තරය	සංඛ්‍යාව
2024 01.01.දිනට ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව	1157
වර්ෂය තුළ ලැබූ නව ඉල්ලුම්පත් සංඛ්‍යාව	642
සමාලෝචනය සඳහා හා නිෂ්ප්‍රභා ඉල්ලීම් සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව	247
ප්‍රධාන ශාඛාව වෙත සහ ශාඛා මණ්ඩල වෙත ලද අයදුම්පත් සංඛ්‍යාව	12
මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව	2058
සමථයට පත්කල ඉල්ලුම්පත් සංඛ්‍යාව	313
නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	170
සමාලෝචනය කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	86
සහතික නිකුත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	59
ඉල්ලා අස්කරගත් ඉල්ලුම්පත් සංඛ්‍යාව	91
රෝලෙන් ඉවත් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	97
පසෙක තබන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	31
ශාඛා මණ්ඩල වෙත යවන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	13
අවසන් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව	453
පියවර ගත් මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව	1313
ඉතිරි අයදුම්පත් සංඛ්‍යාව	745
මුදල් ගෙවීම සඳහා නැවත කැඳවන අයදුම්පත් සංඛ්‍යාව	214
2024.12.31 දිනට අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව	**959**

- 2024 වර්ෂයේදි අවසන් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන් 64% ක ප්‍රතිශතයකි.

<u>දිස්ත්‍රික් වශයෙන් ලද අයදුම්පත් සංඛ්‍යාව</u>

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා

ශාඛා	**දිස්ත්‍රික්කය**	**2024.12.31** දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව
ප්‍රධාන/කොළඹ	කොළඹ	**72**
	කළුතර	**74**
	රත්නපුර	**25**
	බදුල්ල	**02**
	අම්පාර	**02**
	නුවරඑළිය	**01**
	මොණරාගල	**02**
	කෑගල්ල	**08**
	නුවර	**01**
ගම්පහ	ගම්පහ	**158**
ගාල්ල	ගාල්ල	**84**
	මාතර	**43**
	හම්බන්තොට	**09**
කුරුණෑගල	කුරුණෑගල	**77**
	කෑගල්ල	**29**
	මහනුවර	**31**
	පුත්තලම	**11**
	මාතලේ	**10**
	අනුරාධපුරය	**02**
	එකතුව	**642**

ශාඛා මණ්ඩලය	**2024.01.01.** දිනට ශාඛා සතුව පවතින ඉල්ලුම්පත් සංඛ්‍යාව	වර්ෂය තුළ ලද අයදුම්පත් සංඛ්‍යාව	**2024.12.31** දිනට අවසන් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	**2024.12.31** දිනට ඉතිරි වී ඇති නඩු සංඛ්‍යාව
ප්‍රධාන මණ්ඩලය	162	95	52	109
කොළඹ ශාඛා මණ්ඩලය	159	93	49	113
ගාල්ල ශාඛා මණ්ඩලය	212	136	185	76
ගම්පහ ශාඛා මණ්ඩලය	383	158	47	293
කුරුණෑගල ශාඛා මණ්ඩලය	241	160	120	154
එකතුව	**1157**	**642**	**453**	**745**

මූල්‍ය ප්‍රගතිය

වැය විෂය	2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු මි.)	2024.12.31 දිනට වියදම (රු මි.)	2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (%)
ප්‍රාග්ධන වියදම	3.10	2.62	84.44
පුනරාවර්තන	78.13	66.47	85.08
එකතුව	81.23	69.09	85.05

දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම

ණය සහනදායක මණ්ඩල මේ වන විට කොළඹ 08, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවතෙහි අංක 35 ඒ, දරණ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන අතර දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම පාහේ ණයසහනදායක මණ්ඩලයේ සහනපතා දෙනිකව කොළඹට පැමිණෙන මහජනතාවගේ පහසුව සඳහා දෙනිකව ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන්, මහජනතාව වෙත කාර්යක්ෂමව සේවාව සැපයීම සඳහාත්, ණය සහනදායක මණ්ඩලයේ සේවාව දීපව්‍යාප්ත කිරීමේ අරමුණින් 2019 අංක 04 දරණ ණය සහනදායක (සංශෝධිත) පනත අනුව ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලය ලෙස පුළුල් කරන ලදි.

ඒ අනුව, ණය සහනදායක මණ්ඩලය සඳහා දෙනිකව ලැබෙන අයදුම්පත් අනුව වැඩි වශයෙන් අයදුම්පත් ඉදිරිපත් වන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගනිමින් ගාල්ල, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ශාඛා මණ්ඩල පිහිටුවන ලදි. තවද උතුර, උතුරුමැද, වයඹ සහ මධ්‍යම පළාත් ද ආවරණය වන ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ශාඛා මණ්ඩලයක් ද පිහිටුවා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලයේ සේවාව ඉතා කාර්යක්ෂම සහ ඵලදායී අයුරින් මහජනතාව වෙත ලබාදීමට බලාපොරොත්තු වෙමු.

රාජ්‍ය ගිණුම් කාරක සභාවේ යෝජනාව පරිදි ඉදිරියේ දී ප්‍රතිපාදන ලැබෙන අයුරින් අනෙකුත් පළාත් ආවරණය වන පරිදි ශාඛා මණ්ඩල පිහිටුවීමට සැලසුම් සකස් කරමින් පවතී. එමෙන්ම සේවය වඩා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා ධාරිතා සංවර්ධනය හා කාර්යාල උපකරණ මිල දී ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. එමෙන්ම ආයතනය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා ජනමාධ්‍ය භාවිතයෙන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පියවර ගනිමින් පවතී.

D. S. Dayananda

සුභාෂිණී දයානන්ද


ලේකම්

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

03. පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය



ඒසිඒ-එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තක්ෂ 2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ACA1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		67,757,000	59,854,000	ACA-3
-	තැන්පතු		300,873	116,454	ACA-4
-	අක්තිකාරම් ගිණුම්		1,203,210	1,076,517	ACA-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**69,261,083**	**61,046,971**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**69,261,083**	**61,046,971**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		644,075	233,684	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		68,617,008	60,813,287	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
45,130,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	39,874,644	34,337,031	
32,900,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	26,565,899	26,023,106	ACA-2(ii)
100,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	28,640	30,484	
-	පොළී ගෙවීම්	8		-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
78,130,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**66,469,183**	**60,390,622**	
	මූලධන වියදම්				
1,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	867,000	-	
1,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,486,116	493,470	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ACA-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
400,000	හැකියා වර්ධනය	14	264,500	90,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	

1

3,100,000	මුළු මූලධන වියදම් (උ)	2,617,616	583,470	
	කැන්පකු ගෙවීම්	223,187	111,179	ACA-4
	අත්තිකාරම් ගෙවීම්	1,471,536	1,067,800	ACA-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)	1,694,723	1,178,979	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)	70,781,522	62,153,070	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)	(2,164,514)	(1,339,783)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය	(2,213,661)	(1,339,783)	ACA-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	49,147		ACA-3
		-	-	

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	13,202,235	11,716,119
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	2,757,229	2,488,903
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	49,147	-
		16,008,611	14,205,022
මුළු වත්කම්			
ශුද්ධ වත්කම් / ස්වාමිත්වය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,674,268	2,488,903
දේපළ පිරියත හා උපකරණ සංචිතය		13,202,235	11,716,119
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	82,961	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	49,147	-
මුළු වගකීම්		16,008,611	14,205,022

පිටු අංක 08 සිට 27 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් පොරතුරු සහ ඇතුළුම් පිටු අංක 28 සිට 33 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් පොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකරණය ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

නම : ජනාධිපති නීතිඥ, අයේෂා ජිනසේන

තනතුර : ලේකම්, අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

දිනය : 28/02/2025

ගණන්දීමේ නිලධාරී

නම : සුභාෂිණී දයානන්ද

තනතුර : ලේකම්, ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

දිනය : 2025.02.25

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)

නම : ජී.ටී.ඊ දිල්රුක්ෂි

දිනය : 2025.02.25

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10

සුභාෂිණී දයානන්ද
ලේකම්
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක 35 ඒ, ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.

ජී.ටී.ඊ. දිල්රුක්ෂි
ගණකාධිකාරී (වැ.බ.)
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක 35, ඒ. ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත
කොළඹ 08.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර්ය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩායම	
	2024 රු.	**2023** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,913,975	1,524,252
අග්‍රිම ලැබීම්	67,757,000	59,854,000
අත්තිකාරම් අයකර ගැනීම්	1,459,746	909,397
තැන්පතු ලැබීම්	300,873	116,454
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**71,431,594**	**62,404,103**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	66,397,393	60,129,986
සහනාධාර සහ මාරුකිරීම්	28,640	30,484
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	247,500
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	644,075	233,684
අත්තිකාරම් ගෙවීම්	1,471,536	1,067,800
තැන්පතු ගෙවීම්	223,187	111,179
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**68,764,831**	**61,820,633**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,666,763**	**583,470**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	2,617,616	583,470
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,617,616**	**583,470**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(2,617,616)**	**(583,470)**

මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	49,147	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	49,147	-

3.2 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් සංකේතය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (.රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොලිය - අනෙකුත්	90,000.00	90,000.00	117.642.14	130.71%
20.03.99.00	විකුණුම් සහ ගාස්තු අනෙකුත් ලැබීම්	570,000.00	570,000.00	868,386.50	152.34%
20.04.01.00	වෙනත්	780,000.00	780.000.00	927,946.09	88.55%

3.3 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ලෙස %
	මූල්‍ය ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	76,800,000/-	78,130,000/-	66,469,183/-	85%
ප්‍රාග්ධන	2,100,000/-	3,100,000/-	2,617,616/-	84%

3.4 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවටම ප්‍රධානය කරන ලද ප්‍රධාන ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන	තත්‍ය වියදම	උපයෝගි කරගන්නා ලද ප්‍රතිපාදන ලබා අවසාන ප්‍රතිපාදනවල ලෙස %
අදාල නොවේ					

3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම්	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ	11,716,118.97	13,202,334.72	-	100%

3.6. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/A/DDCB/FA/2024/17 ඔබේ අංකය உமது இல. Your No.

02 JUN 2025 දිනය திகதி Date 2025 මැයි 29 දින

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

ලේකම්
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර්16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කළින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අත්තිකාරම් ගෙවීම්

(අ) භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම්වලින් මුදල් ගෙවීම් රු.997,000ක් වුව ද, එය රු.474,536ක් ලෙස රු.522,464ක් අඩුවෙන් ද, හරස් සටහන් මඟින් ගෙවීම් භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව රු.474,536ක් වුව ද, එය රු.997,000ක් ලෙස රු.522,464ක් වැඩියෙන් ද, මූල්‍ය ප්‍රකාශනවල ACA 5 ආකෘතියෙහි දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව අත්තිකාරම් ගිණුමට වර්ෂය තුළ මුදලින් බැරකිරීම් රු.985,210ක් වුව ද, රු.218,000ක් ලෙස රු.767,210ක් අඩුවෙන් ද, හරස් සටහන් මඟින් ලැබීම් භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව රු.218,000ක් වුව ද, රු.985,210ක් ලෙස රු.767,210ක් වැඩියෙන් ද, මූල්‍ය ප්‍රකාශනවල ACA 5 ආකෘතියෙහි දක්වා තිබුණි.

1.6.2 අග්‍රිම ශේෂය

(අ) භාණ්ඩාගාර මුද්‍රිත SA 71 අනුව වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම් රු.1,177,100ක් වුව ද, එය මූල්‍ය ප්‍රකාශනවල ACA 3 ආකෘතියෙහි දක්වා නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත SA 71 අනුව වියදම් මඟින් අග්‍රිම පියවීම රු.68,240,878ක් වුව ද, එය රු.67,112,925ක් ලෙස රු.1,127,953ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ACA 3 ආකෘතියෙහි දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 13ක හා මූලධන වැය විෂයයන් 03ක ප්‍රතිපාදිත රු.62,610,000කින් රු.11,718,665ක් ඉතිරි වී තිබුණු අතර, එය සියයට 10 සිට සියයට 71ක පරාසයක් දක්වා විහිදී තිබුණි.

(ආ) 231–1–1–0–1003-11 වැය විෂයය සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.2,330,000ක් වෙන්කර ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට එසේ වෙන් කරන ලද වටිනාකම සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණු අතර, එම වැය විෂයයේ ප්‍රතිපාදනවල මුළු ඉතිරිය රු.4,921,627ක් වී තිබුණි. 2024 මාර්තු 26 දිනැති ණය සහනදායක මණ්ඩලයේ ලේකම් විසින් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ අංක DCB/AC/03/06/2024 ලිපිය අනුව රු.10,000ක ජීවන වියදම් දීමනා ගෙවීම සඳහා පවතින ප්‍රතිපාදන සමඟ අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් පරිපූරක ඉල්ලීම්කර තිබුණි.

(ඇ) 231-1-1-0-1101-11 වැය විෂයයෙහි ඉතිරිවීම් සියයට 67ක් වූ අතර, ශාඛා කාර්යාල පිහිටුවීම මත කාර්යයන් විමධ්‍යගත වීම නිසා ගමන් වියදම් අවමවීම ලෙස ඉතිරිවීම්වලට හේතු දක්වා තිබුණ ද, 2024 වර්ෂය තුළ ශාඛා කාර්යාල පිහිටුවීමට කටයුතුකර නොතිබුණි. අවසන්වරට ශාඛා කාර්යාල පිහිටුවා තිබුණේ 2022 වර්ෂයේ බැවින් මෙම හේතුව විගණනයට පිළිගත නොහැකි විය.

(ඈ) 231-1-1-0-1401-11 වැය විෂයයෙහි ප්‍රතිපාදන මුදල වූ රු.200,000ක සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර, දෙපාර්තමේන්තුව තුළ ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධාරීන් නොමැති වීම මෙම ඉතිරිවීම්වලට හේතු ලෙස දක්වා තිබුණ ද, ප්‍රවාහන දීමනා සඳහා හිමිකම් සහිත තනතුර වෙනුවෙන් වාහනයක් වෙන්කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය තුළ ප්‍රවාහන දීමනා හිමිකම් සහිත වෙනත් තනතුරු ඇතුළත් වී නොතිබුණි.

(ඉ) 231-1-1-0-1404-11 වැය විෂයයෙහි රු.2,068,000ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 14 ක ඉතිරිවීම් සඳහා ශාඛා මණ්ඩල පිහිටුවීම ප්‍රමාද වීම ලෙස හේතු දක්වා තිබුණ ද, 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට නව ශාඛා මණ්ඩල ස්ථාපිත කිරීම ඇතුළත්කර නොතිබුණි.

(ඊ) 231-1-1-0-1506-11 වැය විෂයයෙහි රු.71,360ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 71ක ඉතිරිවීම් සඳහා දේපල ණය ලබාගත් නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ අවමවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම ලෙස හේතු දක්වා

තිබුණ ද, 2023 වර්ෂයේ ද මෙම වැය විෂයයෙහි ඉතිරිවීම්වලට හේතුව ලෙස ඉහත කරුණම දක්වා තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.

(උ) 231-1-1-0-2401-11 වැය විෂයයෙහි රු.135,500ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 34ක ඉතිරිවීම් සඳහා පුහුණු ආයතන මඟින් පුහුණු වැඩසටහන් අනපේක්ෂිත අයුරින් 2025 වර්ෂයට කල් තබා ඇති බව හේතු ලෙස දක්වා තිබුණ ද, කාර්යමණ්ඩල පුහුණු කිරීම් 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණි.

3.2 **නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**
(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 හා 5.4.12 වගන්ති	වැටිබඳු සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ට වැටිබඳු ආවරණය කිරීමට මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්විය යුතු වුව ද, ගෙවීම් පිළිබඳ විස්තර එසේ එවා නොතිබුණි.
(ආ) 2019 අංක 04 දරන ණය සහනදායක (සංශෝධන) පනත	
i. 1(1) වගන්තිය	ණය සහනදායක මණ්ඩලයේ සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුව ද, සාමාජිකයන් 09 දෙදෙනෙකුට පමණක් මණ්ඩලය සීමා වී තිබුණි.
ii. 8(3) වගන්තිය	නීතීඥවරයෙකු ලෙස අවුරුදු 10කට නොඅඩු වෘත්තීය අත්දැකීම් සහිත හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I වන ශ්‍රේණියේ ධුරයක තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන්ගෙන් මණ්ඩල සාමාජිකයන් සමන්විත විය යුතු වුව ද, එයට පරිබාහිරව ගාල්ල ශාඛා මණ්ඩලයට එක් සාමාජිකයකු පත්කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සාමාජික දීමනා, ගමන් වියදම් දීමනා හා ඒකාබද්ධ දීමනා ලෙස එකතුව රු.994,500ක් ගෙවා තිබුණි.

(ඇ) 2011 ජනවාරි 21 දිනැති අංක 1689/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව

සභාපතිවරයා සහ මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයේ සෑම සාමාජිකයෙක්ම තම නිවසින් බැහැරව නිල කාර්යයක යෙදී සිටින විට ඔහුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි 12 වැනි වගන්තිය ප්‍රකාරව රු.500ක ඒකාබද්ධ දීමනාවක් ගෙවිය යුතු ලෙස සඳහන් වුව ද, උක්ත චක්‍රලේඛය පරිදි සංයුක්ත දීමනා ගෙවීමේදී ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව මණ්ඩලයේ සාමාජිකයන් පැමිණීමේ පිටවීමේ වේලාව සටහන් නොකරන බැවින් කොපමණ කාලයක් කාර්යයේ නිරත වූවා ද යන්න තහවුරුකර ගැනීමකින් තොරව රු.1,909,000ක මුදලක් ඒකාබද්ධ දීමනා ලෙස ගෙවීමකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

(අ) 2024 දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබුණු තථ්‍ය නඩු සංඛ්‍යාව 745ක් වූ අතර, එය වර්ෂය තුළ විසඳීමට තිබුණු 2,058ක් වූ මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 36ක අගයක් ගෙන තිබුණි. මේ තුළ ප්‍රධාන මණ්ඩලයේ නඩු 109ක් ද, කොළඹ ශාඛාවේ නඩු 113ක් ද, ගම්පහ, කුරුණෑගල, සහ ගාල්ල ශාඛා කාර්යාලවල නඩු සංඛ්‍යාව පිළිවෙලින් 293ක්, 154ක්, සහ 76ක් ලෙස ඉතිරි වී තිබුණි. ඒ අනුව වර්ෂය තුළ විසඳීමට තිබුණු නඩු සංඛ්‍යාව හා සැසඳීමේදී 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි නඩු සංඛ්‍යාවෙහි වැඩිම ප්‍රතිශතය ගම්පහ ශාඛාවෙන් වූ අතර, එය සියයට 50ක අගයක් ගෙන තිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට විභාග වන නඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද කාලවිශ්ලේෂණයට අනුව අවුරුදු 03ත් 05ත් අතර නඩු සංඛ්‍යාව 100ක් ද, අවුරුදු 05ත් 10ත් අතර විභාග වන නඩු සංඛ්‍යාව 113ක් හා අවුරුදු 10ට වැඩි විභාග වන නඩු සංඛ්‍යාව 17ක් ලෙස පැවතුණි. ඒ අනුව වසර 03ට වැඩි කාලයක සිට නොවිසඳා තිබුණු නඩු සංඛ්‍යාව 230ක් වූ අතර, එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබුණු 959ක් වූ මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 24ක අගයක් ගෙන තිබුණි.

(ඇ) 2009 වර්ෂය දක්වා භාරගන්නා ලද මෙතෙක් නොවිසඳුණු නඩු 06ක් 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබුණු අතර, වසර 15කට අධික කාලයක සිට නොවිසඳී පැවත එන නඩු මේ තුළ පැවතුණි.

4.1.2 **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුව ද, 2023 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගතකර තිබුණේ 2024 අගෝස්තු 29 වන දින ය.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර නොතිබුණි.

4.2 **ප්‍රසම්පාදනයන්**

(අ) <u>ඩෙක්ස්ටොප් යන්ත්‍ර 04 ක් මිලදීගැනීම</u>

ඩෙක්ස්ටොප් යන්ත්‍ර 04ක් මිලදීගැනීම සඳහා තෝරා ගත් ආයතනන 05කින් මිලගණන් කැඳවා තිබූ අතර, ආයතන 03ක් පමණක් මිලගණන් ඉදිරිපත්කර තිබුණි. පිරිවිතරයට අනුව Processor අවශ්‍යතාවය Intel Core i3 – 12th Gen or i5 ලෙස සඳහන්කර තිබුණ ද, තෝරාගත් සැපයුම්කරු Processor i3 සහ i5 සඳහා මිලගණන් ඉදිරිපත්කර තිබූ අතර, ඉතිරි ලංසුරුවන්ගේ ලංසුවල සඳහන්කර තිබූ Processor වර්ගය i3 ද, i5 ද යන්න විගණනයේදී පැහැදිලිව හඳුනාගැනීමට නොහැකි විය.

(ආ) <u>ශාඛා කාර්යාල සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදීගැනීම.</u>

ශාඛා කාර්යාල සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර 03ක් රු.195,000ක වියදමක් දරා මිලදීගැනීමේ ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව විෂයය පිළිබඳ විශේෂඥයෙකුගෙන් සමන්විත විය යුතු වුව ද, 2024 ජනවාරි 31 දින පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව එකී කොන්දේසි සපුරා නොතිබුණි. තව ද, මිලගණන් කැඳවීමට ලිපි යැවීමෙන් පසුව එනම්, 2024 පෙබරවාරි 13 වන දින වෙනත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් දෙපාර්තමේන්තුවේ ලේකම් විසින් පත්කර තිබුණු අතර පිරිවිතර පිළියෙල කිරීමේදී ඇඟිළි සලකුණු යන්ත්‍ර සඳහා ලබාදෙන වගකීම් කාලය පිළිබඳව අවධානය යොමු නොකර පිරිවිතර පිළියෙලකර තිබුණි.

4.3 **රජයේ නිලධාරීන් ඇපකැබීම**

මූදල් රෙගුලාසි 880 ප්‍රකාරව පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද, රජයේ ගිණුමට අදාළ වවුවර සහතික කරන, වෙක්පත් අත්සන් කරන අය ද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 15 දෙනෙකු ඇප තබා නොතිබුණි.

4.4 **කළමනාකරණ දුර්වලතා**

(අ) 2024 ජූනි මාසයට අදාළ ජල බිල්පත් වටිනාකම රු.86,046ක් වී තිබූ අතර, එවැනි අසාමාන්‍ය වටිනාකමක් ඉදිරිපත් වුව ද, ඒ පිළිබඳ සොයා බලා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රමාදය හේතු කොට ගෙන 2024 ජූලි මාසය සඳහා ද, රු.86,046ක අසාමාන්‍ය බිල්පත් වටිනාකමක් ඉදිරිපත් වී තිබුණි. ජූලි මාසයේ නව ජල මාපාංකයන් සවිකර තිබියදී කුරුණෑගල ශාඛා කාර්යාලයේ අගෝස්තු සිට නොවැම්බර් දක්වා වූ මාස 04 සඳහා ද, වටිනාකම රු.62,634ක් වූ ජල බිල්පත් වෙනුවෙන් කුරුණෑගල මහ නගර සභාව වෙත ගෙවීම්කර තිබුණි. මෙම වටිනාකම සමාලෝචිත වර්ෂයේ පළමු මාස 6 හා සැසඳීමේදී ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) කුරුණෑගල ශාඛා බලප්‍රදේශයට දිවයිනේ අධිකරණ බලප්‍රදේශ 34න්, 14ක කාර්යයන් පැවරී තිබුණ ද, 2024 වර්ෂය සඳහා ණය නිරවුල්කර දෙන ලෙසට වූ ඉල්ලීම් සම්බන්ධ අයදුම්පත් 160ක් ඉදිරිපත් වී තිබූ අතර, දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය අඩුවීම මත දෙපාර්තමේන්තුවේ සේවය ලබාගැනීමට අයදුම්පත් ඉදිරිපත් වීමේ අඩුවක් ඇති බව මේ අනුව නිරීක්ෂණය වේ. වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් 09ක් සිදුකර තිබුණ ද, ඉහත ප්‍රදේශ ඉලක්කකර ගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මකකර නොතිබුණු අතර, දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත්කර නොතිබුණි.

5 මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්තකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ මට්ටම	02	01	01
ද්විතීක මට්ටම	39	22	17
ප්‍රාථමික මට්ටම	09	09	-
	50	32	18

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදුකළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුව ද, ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ ඇතුළත් ගණකාධිකාරී තනතුර 2021 මාර්තු 17 වන දින සිට පුරප්පාඩුව පවතින අතර, අමාත්‍යාංශයේ ගණකාධිකාරී විසින් මෙම තනතුරෙහි වැඩ බැලීම සිදුකරනු ලබයි. වැඩ බැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.187,263ක් ගෙවා නිබුණි.

(ආ) ද්විතීක මට්ටම තුළ ඇතුළත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 18ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 16ක් වූයෙන් පුරප්පාඩු 02ක් පැවති අතර, කළමනාකරණ සේවා තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 15ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 06ක් වූයෙන් පුරප්පාඩු 09ක් පැවතුණි. තව ද, ලඝු ලේඛක තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 06ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාවක් නොමැති වූයෙන් එම තනතුර සම්පූර්ණයෙන්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී නිබුණි.

යූ.එන්.ඉලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට (වැ.බ)

04 වන පරිච්ඡේදය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම (%)		
	%90 - %100	%89 - %75	%74 - %50
කාර්ය මණ්ඩල අභිප්‍රේරණය	-	75%	-
දෙපාර්තමේන්තුවේ සේවාව සැපයීම හා ලබන ප්‍රචාරණය	-	85	-
දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවයෙහි ඵලදායිතාවය	-	80%	-

05 වන පරිච්ඡේදය

තිරසාර සංවර්ධනය අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක අරමුණු /	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			%49 - %0	%74- %50	%75 - %100
නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ උකස්කර පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගණුදෙනු සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු හා අනෙකුත් බැඳීම් කෙරෙහි වූ අයවිය යුතු ණය සම්මුති වලට පාර්ශවයන් පැමිණවීම	ණය සහනදායක මණ්ඩලය විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාව පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම	ණය සහනදායක මණ්ඩලයේ ශාඛා ගම්පහ , කුරුණෑගල හා ගාල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවීම හා කොළඹ දිස්ත්‍රික්කයේද නව ශාඛා මණ්ඩලයක් පිහිටුවීම.			85%

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ණය සහනදායක මණ්ඩලයේ ශාඛා මණ්ඩල ගම්පහ, ගාල්ල සහ කොළඹ යන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් පිහිටුවා පවත්වාගෙන යනු ලැබේ.

06 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	02	01 01 (වැ.බ)	01
තෘතියික	නැත	නැත	නැත
ද්විතියික	39	24 (02 අනුයුක්ත)	17
ප්‍රාථමික	09	09	0

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දෙපාර්තමේන්තුවේ සේවාව කාර්යක්ෂමව හා ඵලදායිව මහජනතාව වෙත ලබා දීමට දෙපාර්තමේන්තුව තුළ පවතින සේවක පුරප්පාඩු බෙහෙවින් බලපෑම් සිදුකරනු ලබයි.

මෙම තුළ දීර්ඝ කාලයක සිට පැවැති ලඝුලේඛක පුරප්පාඩු 2024 වසර තුළ සම්පූර්ණ කරන ලද අතර ලඝු ලේඛිකාවන් 6 දෙනෙකු සේවයට බඳවා ගන්නා ලදි.

දෙපාර්තමේන්තුව තුළ පවතින විෂයන් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති වීම හේතුවෙන් එක් සේවකයෙකුහට විෂයන් කිහිපයක් ආවරණය කිරීමට සිදුවිය. එහෙයින් දෙපාර්තමේන්තුවේ සේවය කාර්යක්ෂමව සැපයීමට බාධා සිදු විය. මේවන විට ගණකාධිකාරී සේවයේ එක් නිලධාරියෙකු, කළමනාකරණ සේවා නිලධාරීන් 09ක් හා සංවර්ධන නිලධාරී 2ක අඩුවක් පවතී. අනුමත සේවක සංඛ්‍යාව 50 ක් වුවද කාර්යක්ෂම සේවයක් පවත්වාගෙනයාම සඳහා ශාඛා කාර්යාල සඳහා ලඝු ලේඛක තනතුරු 2ක් හා කාර්යාල කාර්ය සේවයේ තනතුරු 2 බැගින් පැවතීම අත්‍යවශ්‍යව පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (දේශීය) රු.	වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
Government payroll system	02	දින 01	39,000.00	දේශීය	වැටුප් සකස් කිරීම
රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයින් සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි	03	දින 02	39,000.00	දේශීය	විනය හා කාර්යාලයීය ආචාර විධි
Safe, scientific Economical	01	දින 01	6000.00	දේශීය	පරිසර හිතකාමී රිය පැදවීම
Financial regulation	01	දින 01	7000.00	දේශීය	මුදල් රෙගුලාසි මූලික දැනුම
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණ පාඨමාලාව	03	දින 02	39,000.00	දේශීය	ගබඩා කළමණාකරනය, වත්කම් අපහරණය
Public procurement procedures	01	දින 01	40,000.00	දේශීය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
කාර්යාල සේවක සේවයේ ආචාර විධි හා විනය	01	දින 02	13,000.00	දේශීය	කාර්යාල සේවක සේවයේ ආචාර විධි
Preparation of document with MS word	02	දින 01	15,500.00	දේශීය	MS word මූලික දැනුම
වියදම් හා ගෙවීම් පටිපාටිය	02	දින 01	27,000.00	දේශීය	වවුචර්පත් සැකසීම
Implementation of Public accounting system & preparation of final accounts	02	දින 02	26,000.00	දේශීය	මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ මූලික දැනුම
විනය කාර්ය පටිපාටි	01	දින 02	13,000.00	දේශීය	රජයේ නිලධාරීන්ගේ මූලික විනය කාර්ය පටිපාටිය
එකතුව			264,500.00		

ඒ ඒ විෂය පථයන්ට අදාළව දැනුම හා කුසලතා වර්ධනය කිරීමට උපකාරී වන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම මගින් ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතුව නිවැරදිව විෂය කටයුතු කරගෙන යාමට හැකිවීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා උපකාරී වේ

07 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශගිණුම් නියමිත දිනට / ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරකම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ.		
1.6	වෙනත්	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ස්ථාවර 2018/267 වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනපුද්ගල කාඩ්පත් / යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	මෙම දෙපාර්මේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත . අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කරනු ලබයි.	
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (GIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	දරණ රාජ්‍ය 2004/171 දිනැති අංක 2014.05.11 ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලැසුම් සකස් කිරීම**			

4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	මෙම දෙපාර්මේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත . අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කරනු ලබයි.	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහන ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුමවලට පිළිතුරු දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134 (2) DMA/1 2019 අනුව වසර ආරම්භයේදි විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ අමාත්‍යාංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදි පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර	

			විගණන අංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු කරනු ලබයි.	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිකරවරයාට ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ.	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කෙම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණ සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය , ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා සකස් කොට නියමිත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හීත වී මාස 06 කට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම	අනුකූල නොවේ		
9.3	වාහන ලෝග් පොත පවත්වාගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය විම, නැවත පරික්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්යෙන්ම අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වල පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල නොවේ.		

12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය සිදු කර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් තත්කාර්ය අතුරු අග්‍රිම ගිණුම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම ගිණුම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවතාවගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		

16.3	20.09.17 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසී ප්‍රකාරව තොරතුරු නිලාධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවියක් නොමැති අතර, අධිකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ මෙම දෙපාර්තමේන්තුව පිළිබඳ තොරතුරු සඳහන් වේ.	
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 10වන හා 8වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සම්පාදනය**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම හි දැක්වෙන 01 ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය .සඳහාම වාර්ෂික ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්දනය කිරීම, නිපුණතා සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව